# 'බටලන්ද කොමිසම් වාර්තාව' යනු කුමක් ද?

## එහි අඩංගු මොනවාද? කොමිසමේ වාර්තාවට අනුව අනීතික ක්‍රියා සඳහා වගකිවයුත්තෝ කවුරුන් ද?

ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති සහ සය වතාවක් අග්‍රමාත්‍ය ධූරය දැරූ රනිල් වික්‍රමසිංහ සමග පැවැත්වූ අල් ජසීරා නාලිකාවේ "Head to Head" වැඩසටහන පසුගිය සතියේ විකාශය කෙරුණු අතර, එහි දී රනිල් වික්‍රමසිංහගෙන් "බටලන්ද වධකාගාරය" සම්බන්ධව 'බටලන්ද කොමිසම' ලෙස භාවිත වන ජනාධිපති කොමිසමේ වාර්තාව පදනම් කරගනිමින් අසන ලද ප්‍රශ්න කිරීම් සහ ඔහු විසින් ලබා දුන් පිළිතුරු සමාජයේ දැඩි අවධානයකට ලක්ව තිබේ.



මේ අතර මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොමැති බටලන්ද කොමිෂන් සභාවේ වාර්තාව මෙම සතිය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව කැබිනට් මාධ්‍ය ප්‍රකාශක නලින්ද ජයතිස්ස අද (මාර්තු 11) පැවති කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී මාධ්‍යවේදියෙකු විසින් විමසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් කියා සිටියේ ය.

මාර්තු 10 දින පැවති කැබිනට් රැස්වීම තුළ දී වාර්තාව මෙම සතිය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට තීන්දු කළ බව ඔහු පැවසීය.

ඒ අනුව බොහෝ දෙනෙකු විමසන ප්‍රශ්න වන බටලන්ද වධකාගාරය යනු කුමක් ද? බටලන්ද කොමිසම් වාර්තාව සහ රනිල් වික්‍රමසිංහ අතර ඇති සම්බන්ධතාවය කුමක් ද? සාක්ෂිකරුවන් කොමිසමේදී පවසා ඇත්තේ මොනවා ද? යන්න සම්බන්ධයෙන් ඒ අනුව බීබීසී සිංහල සිදුකළ විමසා බැලීමකි මේ.

### පසුබිම

1980 දශකයේ අවසාන කාලයේ දී එවකට රජය විසින් සිදු කරන ලද බවට චෝදනා එල්ල වූ නීතිවිරෝධී මිනී මැරුම්, කෲර වධ හිංසාවට ලක් කිරීම්, අනීතිකව රඳවා තබා ගැනීම් සමග නිරන්තරයෙන් කියවෙන ස්ථානයක් වන්නේ බටලන්ද වධාකාගාරය යි.

1988-1990 කාලවකවානුවේදී මෙම බටලන්ද නිවාස යෝජනා ක්‍රමය ආශ්‍රිතව අනීතිකව පොලිස් නිලධාරීන් ද මැදිහත්ව මෙලෙස විවිධ පුද්ගලයන් පැහැරගෙන ගොස් ඝාතනය කර ඇති බවට, වධ හිංසා පැමිණ වූ බවට ඒ සම්බන්ධයෙන් හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් පත් කරනු ලැබූ ජනාධිපති කොමිෂන් සභාවේදී හෙළිදරව් වී තිබේ.

### බටලන්ද වාර්තාව යනු කුමක් ද?

පළමු අවස්ථාවේදී එම කොමිසමේ වාර්තාව 1995 සැප්තැම්බර් 20 දින ජනාධිපතිනියට ලබා දිය යුතු බවට නියෝගයේ සඳහන් වුවත් එය දොළොස් වතාවක් පමණ කල් ගොස් හිටපු ජනාධිපතිනියට වාර්තාව ලබා දෙන්නේ 1998 මැයි 05 වන දින ය.

වසර 17ක එක්සත් ජාතික පක්ෂ පාලනයට තිත තබමින් "දූෂණයට, භීෂණයට එරෙහිව" යන මැතිවරණ පාඨයත් සමග 1994 දී බලයට පත් වූ හිටපු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංගගේ එක ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් වූයේ එවකට එක්සත් ජාතික පක්ෂ රජය විසින් සිදු කරන ලද බව කියන වධ හිංසා සහ ඝාතනවලට යුක්තිය ඉටු කරන බව ය.

ඒ අනුව බටලන්ද වධකාගාරය සහ සූරියකන්ද සම්බන්ධයෙන් එකල වැඩි අවධානයක් යොමු විය.

හිටපු ජනාධිපතිනිය බලයට පත් වී කෙටි කලක් ගත වන විට ම බටලන්ද වධ කඳවුර ඇතුළු එම ප්‍රදේශයේ සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීමට ජනාධිපති ධූරයට හිමි බලතල ප්‍රකාරව ජනාධිපති කොමිෂන් සභාවක් පිහිටුවන ලදී.

### 'බටලන්ද කොමිසම් වාර්තාව' යනු කුමක්ද? එහි අඩංගු මොනවාද?

### කොමිසමේ වාර්තාවට අනුව අනීතික ක්‍රියා සඳහා වගකිවයුත්තෝ කවුරුන් ද?

පළමු අවස්ථාවේදී එම කොමිසමේ වාර්තාව 1995 සැප්තැම්බර් 20 දින ජනාධිපතිනියට ලබා දිය යුතු බවට නියෝගයේ සඳහන් වුවත් එය දොළොස් වතාවක් පමණ කල් ගොස් හිටපු ජනාධිපතිනියට වාර්තාව ලබා දෙන්නේ 1998 මැයි 05 වන දින ය.

කොමිෂන් සභාවේ ලේකම් ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හිටපු නිලධාරියෙකු වූ නීතිඥ එස්. ගුණවර්ධන කලක් කටයුතු කර ඇති අතර, ඔහුගේ ඉල්ලා අස්වීමෙන් පසු මෙම කොමිසමේ සහකාර ලේකම්වරයා වූ ඩේවිඩ් ගීගනගේ වැඩබලන ලේකම්වරයා ලෙස කටයුතු කර තිබේ.

පසුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ දෙවන පන්තියේ පළමු ශ්‍රේණියේ නිලධාරියෙකු වූ ජී. කේ. ජී. පෙරේරා කොමිසමේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළේ ය.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී එස්. සී. පතිරණ, එවකට රජයේ නීතිඥ යසන්ත කෝදාගොඩ, ජනාධිපති නීතිඥ ආර්. අයි. ඔබේසේකර, අභියාචනාධිකරණයේ විනිසුරු ඩී. ජයවික්‍රම, මහාධිකරණ විනිසුරු එන්. ඊ. දිසානායක, රජයේ නීතිඥ සරත් ජයමාන්න, නියෝජ්‍ය පොලිස්පති ටී. වී. සුමනසේකර, පොලිස් අධිකාරී එච්. එච්. එම්. ආර්. ප්‍රේමරත්න ඇතුළු පිරිසක් මෙම ජනාධිපති කොමිසමේ අනෙකුත් සාමාජිකයෝ වූහ.

### හිටපු ජනපති රනිල් වික්‍රමසිංහ යටතේ ශ්‍රී ලංකාවේ සිදුවන මානව හිමිකම් කඩවීම් ගැන ජාත්‍යන්තර ප්‍රජාව මුනිවත රකිනවාද?

කෙසේ නමුත් මෙම වාර්තාව මෙතෙක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර තිබීම විශේෂත්වයකි.

1988 ජනවාරි 01 දින සිට 1990 දෙසැම්බර් 31 දක්වා කාලයේ රාජ්‍ය පොහොර සමාගමට අයත් බටලන්ද නිවාස සංකීර්ණයේ, පැවති රජය විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට පුද්ගලයන් රඳවා තබාගැනීම සහ අමානුෂික වධ බන්ධනයන්ට ලක් කළේද යන්න සහ එයට වගකිව යුත්තෝ කවරහුද යන්න ඇතුළු කරුණු 5ක් විමර්ශනය කිරීම මෙම කොමිසමට පැවරුණු වගකීම ය.

මෙම කොමිෂන් සභාවේ ප්‍රසිද්ධ රැස්වීම් 1996 ජනවාරි 16 ආරම්භ වී දින 127ක් පවත්වා තිබෙන අතර සියලු රැස්වීම් කොළඹ අලුත්කඩේ මහාධිකරණ සංකීර්ණයේ අංක 2 මහාධිකරණය තුළ කැඳවා තිබේ.

කොමිසමේ දී සාක්ෂිකරුවන් 82කගෙන් ප්‍රශ්න කර ඇති අතර, පෙර පැවති එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල චරිත වූ රනිල් වික්‍රමසිංහ, ජෝසප් මයිකල් පෙරේරා, ජෝන් අමරතුංග ඒ අතරින් කැපී පෙනෙයි.

මෙම කොමිසමේ සියලු ලිඛිත වාර්තා වෙළුම් 28කින් යුක්ත වී ඇති අතර පිටු 6,780කින් සමන්විත වී තිබිණි.

### බටලන්ද සහ රනිල් වික්‍රමසිංහ

ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම මැතිවරණ කොට්ඨාසයේ බටලන්ද ගම මධ්‍යයේ රාජ්‍ය පොහොර සංස්ථාවට අයත් බටලන්ද නිවාස සංකීර්ණය ඉදි කර තිබේ. ඒකක 64කින් සමන්විත එහි නිවාසවල ප්‍රමාණය සහ පහසුකම් අනුව A" B සහ C ලෙස වර්ග කර තිබුණි.

කොමිසමේ වාර්තාවේ සඳහන් අන්දමට එවකට කර්මාන්ත අමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ එවකට රාජ්‍ය පොහොර නිෂ්පාදන සමාගමේ ඇවරකරු වූ අසෝක සේනානායක දුරකතනයෙන් අමතා පොලිස් නිලධාරීන්ට බටලන්ද නිවාස සංකීර්ණයෙන් නිවාස කිහිපයක් වෙන් කර දෙන ලෙස ඉල්ලීමක් සිදුකර තිබේ.

පොහොර සංස්ථාව හරහා මෙම නිවාස භාරගෙන ඇති නිලධාරියා වශයෙන් හඳුනාගෙන ඇත්තේ සහකාර පොලිස් අධිකාරීවරයෙකු වූ ඩග්ලස් පීරිස් ය.

පොලිස් නිලධාරීන්ට බටලන්ද නිවාස සංකීර්ණයේ නිවාස ලබාදීම හුදෙක්ම රනිල් වික්‍රමසිංහගේ උපදෙස් මත සිදුවූවක් බවද, ඔහු එසේ උපදෙස් නොදුන්නේ නම් තමා එසේ පොලිස් නිලධාරීන්ට නිවාස ලබා දීමක් සිදු නොකරන බව රජයේ පොහොර නිෂ්පාදන සංස්ථාවේ ඇවරකරු වන අසෝක සේනානායක කොමිසම හමුවේ සාක්ෂි ලබා දී තිබේ.

මෙම නිවාස ලබා දීමට අදාළව කිසිඳු ගිවිසුමක් අත්සන් කර නොමැති වීමද විශේෂත්වයක් වන අතර, එවකට පොලිපතිවරයා වූ අර්නස්ට් පෙරේරා කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පවසා ඇත්තේ මෙය "ඩග්ලස් පීරිස් මහතා හා සංස්ථාවේ නිලධාරීන් සහ අදාළ අමාත්‍යවරයා අතර පෞද්ගලික ගනුදෙනුවක්," ලෙස පෙනෙන බව ය.

මෙම නිවාස සංකීර්ණයේ 2/2 නිවස 1983 මාර්තු 02 සිට 1994 අගෝස්තු මාසය දක්වා රනිල් වික්‍රමසිංහ තමා විසින් දැරූ යෞවන කටයුතු සහ රැකීරක්ෂා අමාත්‍යවරයාගේ සංචාරක බංගලාව වශයෙන් ද, කර්මාන්ත අමාත්‍යවරයාගේ නිල නිවාස වශයෙන් ද භාවිත කරනු ලැබ තිබේ.

මෙම කොමිෂන් වාර්තාවේ පුද්ගලයින් නීති විරෝධීව රඳවා තබා වධ දීමට භාවිත කරන ලද නිවාස මොනවාදැයි දක්වා තිබේ. එහි ඉංග්‍රීසි වාර්තාවේ පිටු අංක 23 සිට 26 දක්වා සඳහන් ආකාරයට, එම නිවාස අංක සහ ඒවා භාවිත කළ අරමුණු හා පුද්ගලයින් පහත පරිදි ය.

B 2: 1989 සිට 1994 අගෝස්තු දක්වා රනිල් වික්‍රමසිංහගේ කාර්යාලය

මෙම නිවසේ තමාව බලහත්කාරයෙන් රඳවා ගත්තේ යැයි කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ටී. එම්. බන්දුල යන අය ප්‍රකාශ කර ඇති අතර, කොමිසම නිවාස සංකීර්ණය පරික්ෂා කිරීමට ගිය අවස්ථාවේ ඔහු නිවස හඳුනාගෙන ඇත.

B 1: රනිල් වික්‍රමසිංහට වෙන් කළ ආරක්ෂක නිලධාරීන් රැඳී සිට ඇත.

E 7: රනිල් වික්‍රමසිංහගේ පෞද්ගලික ආරක්ෂක නිලධාරී පොලිස් පරීක්ෂක සුදත් චන්ද්‍රසේකර රැඳී සිට ඇත.

B 8: සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස්ගේ ආරක්ෂක නිලධාරීන් රැඳී සිට ඇත.

මෙම නිවස තමාව බලහත්කාරයෙන් රඳවා, වධ දීමට ලක් කළ නිවස ලෙස සාක්ෂිකරු අර්ල් සුගී පෙරේරා විසින් හඳුනාගෙන තිබේ. මෙම ඊ 8 නිවස ඊ 7 නිවස ආසන්නයේ සහ සහකාර පොලිස් අධිකාරී ඩග්ලස් පීරිස් රැඳී සිටි බවට වාර්තාවේ සඳහන් 2/5 නිවස ඉදිරිපිට පිහිටා ඇත. 1996 මැයි 24 දින කොමිසම විසින් නිවාස සංකීර්ණය පරික්ෂා කිරීමකදී මෙම නිවසේ වීදුරු ජනේලයක "Cats" ලෙස පින්තාරු කර ඇති බව නිරීක්ෂණය වී තිබිණි.

B 34 (සපුගස්කන්ද පොලිසියට පවරා දී තිබේ.)

මෙම නිවසේ තමාව බලහත්කාරයෙන් රඳවා ගත්තේ යැයි වාසල ජයසේකර යන අය විසින් හඳුනාගෙන ඇත.

☞ 23 වෙනි පිටුවට.....